චක්‍රලේඛ අංකය : 01/2007

මගේ අංකය: ප්‍රි:නො.01/පැටි/2007
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
ප්‍රධාන කාර්යාලය,
නො: 280 කෙළින් වීදිය,
කොළඹ 11.
2007.02.07 දින,

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## ඔප්පු ඇතුළු නිත්‍යානුකූල ලේඛන දවස් පොතට භාර ගැනීම

ඇතැම් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයන්හි ලියාපදිංචිය සඳහා දවස් පොතට භාරගන්නා ලද ලේඛන සඳහා කුවිතාන්සි නිකුත් නොකරනු ලබන බවට මා වෙත පැමිණිලි ලැබී තිබේ.

02. මේ සම්බන්ධයෙන් ලේ.ලි. ආඥා පනතේ (117 අධිකාරිය) 27(1) සහ දෙ.නි. 229 (10) වගන්ති කෙරේ ඔබගේ අවධානය යොමු කරවමි.

03. ඒ අනුව දවස් පොතට භාරගන්නා ලද සිතෑම ලේඛණයක් වෙනුවෙන් ඒ 3 ආකෘති පත්‍රය භාවිත කරමින් දවස් පොත් ලිපිකරු විසින් අදාල පුද්ගලයාට රිසිට් පතක් නිකුත් කිරීම අනිවාර්යය බව මෙයින් අවධාරණය කරමි. ඒ සඳහා අවශ්‍ය රිසිට් පොත් දැනටමත් ඔබ කාර්යාලයේ නොමැති නම් වහාම ඒවා ප්‍රධාන කාර්යාලයෙන් (ගබඩා අංශයෙන්) ගෙන්වා ගැනීමට පියවර ගන්නා ලෙසද දන්වමි.

04. කරුණාකර මෙය ලද බව දන්වන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

<u>පිටපත්</u> -

1. කලාප භාර සියලුම සහකාර රෙජිස්ට්‍රාර්වරුන් වෙත. – දැ.ගැ. සහ අ.කා.ස.
2. විගණන අංශය (අභ්‍යන්තර) – අ.කා.ස.

රමය/070207.